**<u>වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය</u>**

**<u>වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා තනතුර</u>**

වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.එම ඉල්ලුම්පත් 2021.01.22 දිනට හෝ එදිනට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**02) අවශ්‍ය සුදුසුකම්**

2.1. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව,ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින්(06) අධ්‍යයන පොදු සහතික පත්‍ර(සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

2.2. අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) විභාගයෙන් දෙවන භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම. ( සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇති අයට දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද, දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇති අයට සිංහල භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද වශයෙනි.)

සහ

2.3. අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

2.4.අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 30 ට නොවැඩි අයෙකු විය යුතුය.

2.5.පහත සඳහන් දිස්ත්‍රික් වලට අයත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල ස්ථිර පදිංචි කරුවන් විය යුතුය.

උපලේඛන අංක 02

| <u>**දිස්ත්‍රික්කය**</u> | <u>**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**</u> |
|---|---|
| රත්නපුර | අයගම,බලන්ගොඩ,ඇලපාත,ගොඩකවෙල,ඉඹුල්පේ,කලවාන, කොලොන්න,කුරුවිට,නිවිතිගල,ඕපනායක,පැල්මඩුල්ල,රත්නපුර |
| මොණරාගල | මොණරාගල, වැල්ලවාය |
| මාතර | කොටපොළ,පිටබැද්දර |
| නුවරඑළිය | අඹගමුව,හඟුරන්කෙත,කොත්මලේ,නුවරඑළිය,වලපනේ |
| කළුතර | බුලත්සිංහල.දොඩංගොඩ,ඉංගිරිය,මදුරාවල,මතුගම, පාලින්දනුවර |
| නුවර | අකුරණ,දෙල්තොට,දොළුව,ගඟඉහළකෝරළේ,ගඟවටකෝරළේ, හතරලියද්ද, කුණ්ඩසාලේ,මැදදුම්බර,පන්විල,පස්බාගේකෝරලේ, පාතදුම්බර,උඩපළාත |
| ගාල්ල | නාගොඩ,තවලම |
| මාතලේ | අඹන්ගඟකෝරළේ,මාතලේ,රත්තොට,උකුවෙල,යටවත්ත |
| බදුල්ල | බදුල්ල,බණ්ඩාරවෙල,ඇල්ල,හල්දුම්මුල්ල,හාලිඇල,හපුතලේ, ලුණුගල, මීගහකිවුල.පස්සර,සොරණාතොට,ඌවපරණගම, වැලිමඩ |
| කෑගල්ල | බුලත්කොහුපිටිය,දෙහිඕවිට,දැරණියගල,රුවන්වැල්ල, යටියන්තොට |

2.5 යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත අයෙකු විය යුතුය.

**03) වැටුප්**

වැටුප් කේත අංකය MN-01 (3/2016)

වැටුප් පරිමාණය රු.27,140-300x10-350x11-495x10-660x10-45,540/-

**04)බඳවා ගැනීමේ ක්‍රමය**

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය මඟින්

**05) සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි**

5.1 මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය).

5.2 මෙම තනතුරු වලට පත්වීම් ලබන්නන් ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවලටද දෙපාර්තමේන්තු නියෝග වලටද රජය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් කොන්දේසි හෝ රෙගුලාසි වලටද යටත් විය යුතුය.

5.3 පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

5.4 තනතුරට පත් වී වසර තුනක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

**06) වෙනත් කරුණු**

6.1අසම්පූර්ණ අයදුම්පත්ද,නියමිත සුදුසුකම් සපුරා නොමැති හා ආදර්ශ අකෘති පත්‍රයට අනුව සම්පූර්ණ කර නොමැති අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.2.මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් පිළිබඳව හෝ සියලු පුරප්පාඩු හෝ පුරප්පාඩු කිහිපයක් හෝ නොපුරවා සිටීම පිළිබඳව තීරණයක් ගැනීමේ අයිතියද ලේකම් වරයා සතුය.

**07) අයදුම් කිරීමේ ක්‍රමය**

මෙයට යාකොට ඇති ආදර්ශ ආකෘතිය අනුව සකස් කර ගත් අයදුම්පත් ග්‍රාම නිලධාරී මඟින් සහතික කර සහතික පත් වල පිටපත් සමඟ ලේකම්, වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය,නො.45,ශාන්ත මයිකල් පාර,කොළඹ 03 යන ලිපිනයට 2021.01.22 දිනට ප්‍රථම එවිය යුතුය.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වුවන් තම ආයතන ප්‍රධානියා මඟින් අයදුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. (අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා" යනුවෙන් සඳහන් කළ යුතුය.)

...............................................
ඩී.පී.ජී.කුමාරසිරි
ලේකම්

2021.01.09
වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය,
නො.45,
ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය**

**කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන-බණ්ඩ 2 සේවා ගණයට අදාළ**

**වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා තනතුර-2021**

(දෙන ලද කොටුව තුළ නිවැරදි සංකේතය / අංකය පැහැදිලිව සටහන් කරන්න.)

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

.........................................................................

(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDENA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :.........................................................................................................

(උදා : GUNAWARDENA, H.M.S.K)

1.3 සම්පූර්ණ නම : ..................................................................................................

(සිංහලෙන් / දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය :

..................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :

..................................................................................................

(සිංහලෙන් / දෙමළෙන්)

3.0

3.1 ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී - ☐ පුරුෂ - ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය :

වර්ෂය ☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 2021.01.22 දිනට වයස :

අවුරුදු | | | | මාස | | | දින | | |

3.4 දුරකථන අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

4.0 4.1 අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස(සා/පෙළ)

විභාග අංකය..................... වර්ෂය...............................

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස(උ/පෙළ)

විභාග අංකය..................... වර්ෂය...............................

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |

5.0 වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

6.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් ☐ ☐ නැත

..............................................................................................................................

7.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් සපයන ලද යම් තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවද මම දනිමි.

(ඇ) තවද සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

,

දිනය : __________ අයදුම්කරුගේ අත්සන

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට ....................................................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන.

දිනය :
සහතික කරන නිලධාරියාගේ නම :
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)